05-03-2012

**මාධ්‍ය නිවේදනය**

වෛද්‍යවරු සිය සේවය සැලසීමේ දී සේවා කාලයේ පමණක් නොව ඉන් පිටත කාලසීමාවේදීද රෝගියාගේ රෝගී තත්ත්වය මත සේවා සැපයීම සඳහා රෝගියා වෙත ළඟා විය යුතුය. මේ කාරණය සඵල කර ගැනීමට

1. රෝහල තුල හෝ ආසන්නයේ පදිංචි වීම සහ
2. කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සලසා ගැනීම අවශ්‍ය වේ

වෛද්‍යවරු අත්‍යවශ්‍ය සේවා සලසන නිළධාරී පිරිසකි. 1990 දශකය වන විට වෛද්‍යවරුන්ට ලැබුණු සධාරණ මූලික වැටුප ඉහත අවශ්‍යතා සපුරා ගැනීම ප්‍රමාණවත් විය. නමුත් දිගින් දිගටම රජයේ වෛද්‍යවරුන්ට ලැබුණු මූලික වැටුප සාපේක්ෂව අවප්‍රමාණ වීම නිසා ඉහත සේවා අවශ්‍යතාවය සපුරා ගැනීමට නොහැකි තත්ත්වයට උද්ගත විය.




**රජයේ නිළධාරීන්ගේ මූලික වැටුප සාපේක්ෂව පහළයාම 1981 වර්ෂයේ සිට.**

මේ පිළිබඳව සලකා

1. **1992 දි රෝහල් අසල වෛද්‍යවරුන්ට රැඳි සිටීම සඳහා රු 2000 ද**
2. **1994 දි ප්‍රවාහන දීමනාව සඳහා රු 3000 ද වශයෙන් එවකට ලබා දුනි.**

අද වන විට,

**වෛද්‍යවරයෙකුගේ මූලික වැටුප රු 26000ක් ද**
**විශේෂඥ වෛද්‍යවරයෙකුගේ වැටුප රු 42000ක් ද වේ.**

එබැවින් මෙය වෛද්‍යවරයෙකුට පිවත් වීම පවා ප්‍රමාණවත් නොවන වැටුපකි.

2007දී වෛද්‍යවරුන්ගේ ප්‍රවාහන සහ රැඳිසිටීමේ දීමනාව යාවත්කාලීන කිරීමේ දී එය රු 29000 දක්වා වැඩිකිරීමට රජය එකඟ විය. නමුත් යුද්ධය නිසා එය ලබා දීම දිනෙන් දින කල් යන ලදි. දැනට පවතින ජිවන තත්ත්වය මත මින් ඉදිරියටත් දැනට පවතින වැටුප් තත්ත්වය යටතේ ඉහත සඳහන් සේවා සැපයීමට අසීරු කාරණයක් බව අපගේ වැටහීමයි.

එබැවින් මෙම හිඟ දීමනාව වහාම ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින අතර එසේ නොවුහොත් අකමැත්තෙන් වුවද වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට නුදුරේදීම එළඹීමට සිදුවන බව දන්වා සිටිමු.

**වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය**